ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
අංක 1902/46 - 2015 පෙබරවාරි මස 19 වැනි බ්‍රහස්පතින්දා - 2015.02.19
(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ පානදුර නගර සභාවේ උප සභාපති ධුරයේ පුරප්පාඩුව පිරවීම

උප සභාපති, සභාපති ධුරයට තේරී පත්වීම හේතු කොට ගෙන පානදුර නගර සභාවේ උප සභාපති ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65අ(1) වන වගන්තිය යටතේ තනතුර දැරූ උප සභාපති වන චක්‍රවර්තිගේ ජෙරාඩ් රියෙන්සි ප්‍රනාන්දු අයත් වන්නාවූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත උප සභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නාවූ ද, ඒ පානදුර නගර සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නිශ්චිත කාල පරිච්ඡේදය ඇතුළත ස්වකීය තීරණය දැනුම් නොදී ඇති හෙයින් ද ;

පානදුර නගර සභාවේ තේරීම් භාර නිලධාරි හැන්නැදිගේ රසික ප්‍රියංග පීරිස් වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, 2011 මාර්තු මස 17 වන දින පානදුර නගර සභාව සඳහා පැවැත් වූ ඡන්ද විමසීමේදී ඊළඟට වැඩිම මනාප සංඛ්‍යාව ලබා ගත් ආර්‍යවංශ පද්ම ශ්‍රී මුණසිංහ මහතා ඒ පුරප්පාඩුව ඇති වූ පානදුර නගර සභාවේ උප සභාපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

රසික පීරිස්,
තේරීම් භාර නිලධාරී,
පානදුර නගර සභාව.

2015 පෙබරවාරි මස 18 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කළුතර.

03 - 136

1A - G 21046— 20 (2015/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.